| 21 | S | I |
|---|---|---|

# Royal College - Colombo 07

## රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 10 – Second Term Evaluation – January 2022

කාලය : පැය 1
Time: 1 hour

## දෙවන වාර පරීක්ෂණය – 2021 ( 2022 ) –10 ශ්‍රේණිය

### *Sinhala language* & Litrecher– I

### සිංහල භාෂාව හා සාහිත්‍ය - I

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශන පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.**

(i) මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.

(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.

(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කවඅතුරෙන් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න

(iv) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

- **අංක 1 සිට අංක 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයන්හි ඉරි ඇඳි පදයේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.**

(01) 2022 ජනවාරි පැවැත්වෙන වාර පරීක්ෂණයෙන් තමා <u>සිකුරට ම</u> ම ඉහළ ලකුණු ලබාගන්නා බව හෙතෙම පැවසීය.
1. ඉතා උසස් ලෙෂ 2. සිකුරගේ පිහිටෙන් 3. සමහර විට 4. නියත වශයෙන්ම

(02) මහෞෂධ පඬිතුමන්ගේ නුවණ නිසා පැරදුණු චූලනී බ්‍රහ්මදත්ත රජුගේ සේනාවෝ <u>හිස් ලූ ලූ අත</u> දිව ගියහ.
1. ඒ මේ අත පැන සැඟවීය.
2. හිස් හැරුණු හැරුණු පැත්තට දිව යාම
3. ලූ ලූ ගාමින් හිස සෙලවීය.
4. හිස් එකින් එක වැද්දා ගැනීම

(03) ප්‍රධානියාගේ <u>මුනිවත</u> රැකීම සේවකයන්ට ප්‍රහේලිකාවක් විය.
1. ආගම සිහිකිරීම 2. දැස් පියාගෙන සිටීම. 3. නිශ්ශබ්දව සිටීම 4. කලබලකාරී වීම

- **අංක 4 සිට 6 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.**

(04) ජීවිත තක්ෂලාවෙන් ලබන පරිනත බුද්ධියත්, ග්‍රන්ථ පරිශීලනයෙන් ලබන දැනුමත් යනුවෙන් අදහස් කරන්නේ,
1. සත්‍යාභ්‍යාසය 2. බහුශ්‍රැතඥානය 3. ප්‍රතිභාව 4. අනුභූතිය

(05) අධ්‍යාපනයේදී ............... හිමිවිය යුත්තේ ප්‍රමාණාත්මකභාවයට නොව ගුණාත්මකභාවයට ය.
1. උචිතානුචිත 2. ප්‍රමුඛත්වය 3. ප්‍රබලත්වය 4. යෝග්‍යතාවය

(06) .......................... ගණයේ නාට්‍ය රචනයක අඩංගු වචන අඩු හෝ වැඩි හෝ නැත.
1. උදාර 2. ශ්‍රේෂ්ඨ 3. විශිෂ්ට 4. උත්තරීතර

(07) අකාරාදි පිළිවෙළ නිවැරදිව දැක්වෙන පද පේළිය තෝරන්න
1. කහවණු, කස්තුරි, කාටිලේජ, කැඩපත 2. ජනාධිපති, ජනප්‍රවාද, ජලජ, ජාතිකාභිමාන
3. තරලය, තරුණ, තලතුනා, තානාපති 4. පලාපල, පාචනය, පාවාඩය, පාරිභෝගික

(08) සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න
1. සමස්ථ, පරිහරණය, කළමනාකරණය, සියළු 2. පෝෂණය, ශිඝ්‍රගාමී, පුස්තකාලය, කනිෂ්ඨ
3. විශිෂ්ඨ, ශ්‍රේෂ්ට, පරිසනකය, ලක්ෂන 4. නිෂ්පාදනය, කුරුළු, පරිච්ඡේදය, උච්ඡාරණය

(09) එක් එක් වචනයෙහි මුල අක්ෂරයෙහි ඇදය / දීර්ඝ පාපිල්ල / ඉස්පිල්ල හා /ඇලපිල්ල පිළිවෙළින් යෙදී ඇති වචන පද තෝරන්න.

1. කැත්ත කුල්ල, මිට, කාලය
2. වැලි, රූපය, ගිරය, කාලය
3. දෙබල, මුල්ල, දූපත, වැට
4. ගෙදර, රූපය, මී කිරි , මාලය

(10) විසර්ගය සහිත පදය තෝරන්න.

1. සංවාදය
2. දුඃඛදායක
3. ෆිල්ටරය
4. සදාශ්‍රය

(11) සුළු වැටුපක් ලබා ගැනීම සඳහා මේ මිනිසුන් කොතරම් වෙහෙස විය යුතුද යන වාක්‍යයේ ''මිනිසුන් ''යනු,

1. උක්ත පදයකි.
2. අනුක්ත පදයකි
3. අනියාමාර්ථ අනුක්ත නාමයකි.
4. අනියාමාර්ථ උක්ත නාමයකි.

(12) මිනිසාගේ යන පදයේ ප්‍රකෘතිය හා ප්‍රත්‍ය වෙන් කළ විට නිවැරදිව යෙදෙන්නේ,

1. මිනි + සාගෙ
2. මිනිසා + ගේ
3. මිනිස් + ආගේ
4. මිනිසා + ආගේ

- **ඉරි ඇඳි පදයේ ක්‍රියා වර්ගය තෝරන්න**

(13) කඩුල්ලේ තරම දනගෙන වැට <u>බඳිනු</u>

1. ආශිර්වාදය
2. මිශ්‍ර ක්‍රියා
3. ප්‍රයෝජ්‍ය ක්‍රියා
4. විධි ක්‍රියා

- **අංක 14 සිට 16 තෙක් ප්‍රශ්නවල ඉරි ඇඳි පදයේ කොටසේ අර්ථය නිවැරදිව දැක්වෙන උත්තරය තෝරන්න**

(14) සී.ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා යහපත් හා සේවයට කැප වූ ගුරු පරපුරක් බිහි කිරීමෙහිලා <u>**පුරෝගාමී**</u> විය.

1. මුල් විය
2. නිරත විය
3. උත්සාහවන්ත විය
4. ඉදිරිපත් විය

(15) භාෂාවේ විවිධ කාව්‍ය නිර්මාණකරණයෙහි යෙදීමේදී කවියාගේ <u>**ප්‍රතිභා ශක්තිය**</u> මැනවින් යොදවයි.

1. විවිධ නිර්මාණ කිරීම
2. අපූර්ව යමක් නිර්මාණය කිරීමට ඇති හැකියාව
3. තිබෙන අයුරින් ම නිර්මාණය කිරීම
4. ප්‍රතිභා ස්වරූපය පෙන්වීම

(16) විභාග ප්‍රතිඵල දැකීමෙන් ඇය තුළ ඇති වූ **ප්‍රහර්ෂය** මුහුණේ පිළිබිඹු ව තිබිණි.

1. දුක්ඛදායක තත්වය
3. බියට පත් වූ බව
2. අධික සන්තෝෂය
4. කලබලයට පත් වූ ස්වභාවය

(17) මුලින් දී ඇති ව්‍යාකරණ පුවර්ගයට අයත් නොවන පදයක් සහිත උත්තරය ලියන්න

1. නිපාත - මෙන්, සේ, බඳු වැනි
2. කෘදන්ත - ලියුම්, හැඩීම්, බැලුම් නැටෙන
3. තද්ධිත - රන්මුවා, පිනිමුවා, රිදී මුවා, සෙලමුවා
4. උපසර්ග - අව, පර, සං, නිර්

(18) යමක් වර්ණනා කිරීම, විස්තර කිරීම , ස්වභාවය දැක්වීම සඳහා යෙදෙන පද

1. විභක්ති පද
2. සන්ධි පද
3. විශේෂණ පද
4. උපමා පද

(19) එක් එක් පද පේළිවල දී ඇති පද යුගලවල සාමානාර්ථවත් පද යුගලයක් ඇතුළත් නොවන පද පේළිය තෝරන්න

1. මුග්ධ - මෝඩ තුරග - අශ්වයා ප්‍රවිෂ්ට - පිවිසීම
2. පොකුණ - පුෂ්කරණී - බල්ලා - සුනඛයා කඩුව - කග
3. සාගින්න - කුසගින්න පියා - පියාපත් දසරුවට - පාදයට
4. උකටලී - කම්මැලි ශෘංගි - විෂ යමුගුරු - යකඩපොලු

(20) ''අකුතගාවා'' යනු

1. කවියෙකි
2. ගීත රචකයෙකි
3. කෙටි කතාකරුවෙකි
4. රංගන ශිල්පියෙකි

(21) විරුද්ධාර්ථ පද යුගලයක් නොවන්නේ,

1. අනුමාන - ප්‍රත්‍යක්ෂ
2. උත්තම් අධම
3. සරල - සංකීර්ණ
4. අචේතනික - නිර්වේතනික

(22) අත්පොඩි හයේ බලයෙන් තොරොක්කෝව රේල් පීලි දිගේ ඉහළට හෙමින් තල්ලු වී ගියේය. මෙහි අත්පොඩි හයේ බලයට අයත් නොවන්නා

1. ර්යෝහෙයි
2. අසල්වැසි ළමයා
3. බාල සහෝදරයා
4. කම්කරුවා

(23) දී ඇති අක්ෂර ගැළපීමෙන් නිර්මාණය වන නිවැරදි සම්භාව්‍ය ග්‍රන්ථ නාමය ඇතුළත් වරය තෝරන්න

1. කුදාවසන 2. යපුලියාන 3. රමාඅතුස 4. ණබුරත්ස

(24) අඝෝෂ අක්ෂර පමණක් යෙදුණු පද පේළිය තෝරන්න

1. ග ජ ඩ ද බ 2. ක ච ට ත ප 3. ය ර ල ව 4. ඟ ඦ ඬ ඳ ඹ

● **අංක 25 සිට 26 යටතේ දී ඇති අදහසට ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න**

(25) සද්දේ තරමට හැකියාව නැත.

1. කකුළුවා පැටවාට කෙළින් යන්නට ඉගැන්වුවා වගේ
2. කට බොරු කිව්වත් දිව බොරු නොකියනවා වගේ
3. නරියා මිදි තිත්තයි කීවා වගේ
4. බුරන බල්ලා සපා නොකනවා වගේ

(26) එක් කරදරයක් පිට තවත් කරදරයක් පැමිණීම

1. අලි මදිවට හරක්
2. දී කිරට බළල්ලුත් සාක්ෂි
3. අනුන්ට කැපූ වළේ තමනුත් වැටේ
4. උඩ පැන්නොත් බිම වැටේ

(27) වැස්ස තේමාව යටතේ කවීන් හතර දෙනෙකු විසින් නිර්මාණය කරන ලද පද්‍යවල මුල් කාව්‍ය පදය බැගින් (අ) කොටසින් ද අපිළිවෙළට සඳහන් කවීන්ගේ නම් (ආ) කොටසින් ද දැක්වේ. ඒ ඒ කොටස් නිසි ලෙස ගැළපී ඇති පිළිතුර තෝරන්න.

| (අ) | (ආ) |
|---|---|
| A - විචිරි චිරි චිචිරි චිරි .... | E - එච් එම් කුලියගම |
| B - පොළොවට වැටෙන හැම වැසි | F - පී.බී.අල්විස් පෙරේරා |
| C - වහිනවා, වහිනවා, වහිනවා ... | G - ඩබ්ලිව්.ඒ. අබේසිංහ |
| D - වලාකුලේ රන් පාටට ... | H - ගුණදාස අමරසේකර |

1. AH, BE, CF, DG
2. AG, BF, CE, DH
3. AE, BG, CH, DF
4. AF, BH, CG, DE

● **අංක 28, 29 යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණ වල නිවැරදි වාක්‍යය තෝරන්න.**

(28)
1. පයින් යන්නෝ පාරේ දකුණු පසින් යා යුතු ය.
2. සියලු මිනිසුන් සත්‍ය ගරුක වීම මැනවි
3. මිනිස්සු අවංක නොවන්නේ ඇයි
4. කම්කරුවන් පස් දෙනෙක් වැඩ කරති

(29)
1. ඒ තෙමේ ගමට ගියහ
3. ඔවුහු තුමූ වැඩ කළේය
2. ඕ තොමෝ පන්සිල් ගත්තාය
4. තෝ ගමට ගියෙහු

(30) A ජනාධිපතිතුමා ...................... ඇමති රැස්වීමට ගියහ.

B ..................................... ඇවිත් යන්න එන්න

C විදුහල්පතිතුමා පැවසූ කරුණු .............................. ළමයි සාකච්ඡා කළහ.

D ප්‍රදර්ශනය ................................ විද්වත් පිරිසක් සහභාගී වූහ.

E සහ F නැවත G පිළිබඳ H සඳහා

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළියෙළ කුමක් ද?

(1) EFGH (2) EGHF (3) HFEG (4) FHEG

(31) පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?

''වරෙල්ලා ආයේත් තල්ලු කරමු.''

1. නැවත පැමිණ තල්ලු කරමු
2. නැවත නැවත තල්ලු කරමු.
3. නැවත ඇවිත් තල්ලු කරමු.
4. එන්න ඇවිත් තල්ලු කරමු.

(32) දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යොන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමග බැඳී නොපවත්නා පද පේළිය ඇතුළත් වරණය තෝරන්න
1. ඇළ, කුඹුර, ජලය, ලියද්ද
2. කමිසය, කලිසම, සපත්තුව, සෙරෙප්පුව
3. නියන, කියත, යතුකැටය, ගඩොල
4. නූල් පන්දුව, ඉඳිකටුව, කතුර, කමිසය

(33) උපමාවක් සහ උපමේය දෙකම යෙදෙන වරණය තෝරන්න
1. කලදෝ දියෙන් පොඟවා
2. නරමුල් ඇඟ ඇට කිඹුලෙකු වැනිය.
3. සඳ මඬල වසාගෙන කළු වලාකුළු
4. අකුණු ගෙඩි ගිගිම් දී විදුලි ඉරි දුවනවා

(34) ''ගැට කෝනමකුට ඉඳ පල ඇද්දෝ '' මෙම කවි පදයේ කෝනමකුට යන වචනයෙන් අදහස් වන්නේ කුමක් ද?
1. කොන්ද නැමුණු මිනිසෙකුට
2. ගුණමකු මිනිසෙකුට
3. යහපත් මිනිසෙකුට
4. නපුරු මිනිසෙකු

(35) පහත සඳහන් ගී ඛණ්ඩයේ ඉතිරි පදය නිවැරදිව යෙදී ඇති උත්තරය තෝරන්න
1. දෙයක් වේ නම් යම්
සුදුස්සාටම අයිති විය යුතු ම
කියන ලෙස මෙලෙද
.......................................................
1. ලැබිය යුතු අයමය
2. ලැබි යුතු අය ලැබිය යුතුම ය
3. ලැබිය යුතුම අය ලැබිය යුතුය
4. ලැබිය යුතු අයම ලැබිය යුතුම ය

(36) වී ගොවිතැනේදී <u>කලවිට</u> යනුවනෙ හඳුන්වන්නේ,
1. ගොයම් 2. කමත 3. කලාතයා 4 පිදුරු

(37) චිරන්තන සාහිත්‍යය උක්තීන් භාවිතයට ගන්නා නූතන සාහිත්‍යකරුවා යන පාඨයෙහි ''උක්තීන්'' යන වචනයේ අර්ථය කුමක් ද?
1. කියමන් 2. හළලත්වය 3. අරුත 4. වටිනාකම

(38) සබවස කුලුණු මෙත් මුදිතා දහම් සැම
සැබවින් රකිති මහ දන දිවි ලෙසින් තම
මොබ තව කුමට සොයම් ද නව උවම් මම
මෙම ලක තමා එවකට එක දහම් බිම
**පෙර රජ දවස ලංකාවේ පද්‍ය පන්තියේ ඇතුළත් ඉහත කවිය රචනා කරන ලද්දේ,**
1. මහගමසේකර මහතා
2. මනෝ ප්‍රනාන්දු මහතා
3. ටිබෙට් ජාතික එස් මහින්ද හිමි
4. මඩවල එස් රත්නායක මහතා

(39) මොණරාගල පළාතේ භාෂා ව්‍යවහාරය අනුව කොකිස් යන්නෙන් අදහස් වන්නේ,
1. ඉඟුරු කරල් 2. කිරි අල 3. පුහුල 4. වට්ටක්කා

(40) වඩාත් සමීප අර්ථය දෙන වැකිය තෝරන්න
පසුගිය කොවිඩ් වකාවානුවේ දී ඇතැම් ව්‍යාපාරිකයන්ගේ සද්භාවය මැනීමට ඇති ඉතා කොට මිම්ම ද ටිකක් දිග වැඩිය.
1. ඇතැම් ව්‍යාපාරිකයන්ගේ අවංකභාවය මැනිය නොහැකිය.
2. සමහර ව්‍යාපාරිකයන්ගේ අවංකභාවය ක්‍රමානුකූලව මැන බැලිය යුතුය.
3. අවංකභාවයෙන් යුක්ත ව්‍යාපාරිකයන් නැත්තේ නොවේ
4. ව්‍යාපාරිකයන්ගෙන් ඇතැමෙක් වංකයෝ ය.

සියලුමහිමිකම්ඇවිරිනි / *All Rights Reserved*

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 11 – Second Term Test – January 2022

දෙවන වාර පරීක්ෂණය - 2022 ජනවාරි - 11 ශ්‍රේණිය

කාලය : පැය 1
Time :1hour

## Sinhala Litereature – II

## සිංහල සාහිත්‍යය – II

| 21 | S | II |
|---|---|---|

Name :- ................................................... Grade : -................ Index number:-....................

❖ **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- ❖ සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ❖ 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ❖ ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

**(i) සිට (x) තෙක් ඇති සියලු ම අනු කොටස්වලට කෙටි පිළිතුරු සපයන්න.**

(i) අ, ආ, ඇ, ඈ, ක, ග, ය, ර, ල, ව යන අක්ෂරවලින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- (අ) කෙටි ස්වර දෙකක් ලියන්න.
- (ආ) අර්ධ ස්වර දෙකක් ලියන්න.

(ii) අක්ෂර වින්‍යාසය නිවැරදි කර පහත වාක්‍ය නැවත ලියන්න.
- (අ) ළමයාගේ වර්දනයට නිදහස ද අත්‍යාවශ්‍ය වන්නේ ය.
- (ආ) පේශ කර්මාන්ත අමාත්‍යාංශය මෙරට රෙදිපිලි නිශ්පාදනය දියුණු කරයි.

(iii) පහත සඳහන් වචනවල පොදු වහර ලියන්න.
- (අ) විසාදිය (ආ) දොඩවනවා

(iv) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.
- (අ) වෛද්‍යවරයා රෝගීන් පරීක්ෂා කරයි.
- (ආ) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා සිංහබාහු නාට්‍ය රචනා කළේ ය.

(v) පහත සඳහන් සන්ධිපද දෙක විසන්ධි කර සන්ධියේ නම ලියන්න.
- (අ) කොග්ගල (ආ) කුරුල්ලා

(vi) පහත සඳහන් වාක්‍ය සදොස් තැන් නිදොස් කොට ලියන්න.
- (අ) මේ දිනවල ශිෂ්‍යයෝ පාඩම් කරති'යි ගුරුවරු විශ්වාස කරයි.

සියලුමහිමිකම්ඇවිරිනි / All Rights Reserved

(vii) මල්ලී පාඩම් කර රූපවාහිනිය නරඹා සටහන් ලියමින් කතා කරයි.

(අ) මෙහි සඳහන් පූර්ව ක්‍රියා පද දෙකක් ලියන්න.

(ආ) මෙහි ඇති මිශ්‍ර ක්‍රියා පදයක් සහ අවසාන ක්‍රියාපදයක් තෝරා ලියන්න.

(viii) පහත දී ඇති පදවල පිල්ලම් කරන්න.

(අ) තරුණී (ආ) කෘතීය

(ix) පහත වචනවලට අර්ථය ලියන්න.

(අ) බුජබල (ආ) පඬුවන්

(x) (අ) ඉක ප්‍රත්‍ය යෙදුණු තද්ධිත නාමයක් ලියා නාම මූලය වෙන් කරන්න.

(ආ) කොරෝනා රෝගයේ ප්‍රවර්ධනයක් සමඟ රෝගීහු වැඩි වූහ. මෙම වාක්‍යයෙහි උපසර්ග පදයක් සහ නිපාත පදයක් ලියන්න.

(2 10=20)

02. පහත සඳහන් ඡේද ඇසුරෙන් එකක් තෝරා ගෙන වචන 250කට නොඅඩු රචනාවක් ලියන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(අ) අප ශ්‍රී ලාංකේයන් වශයෙන් අභිමානවත් ඉතිහාසයකට උරුමකම් කියයි. වසර 40000කට පෙර මෙරට දියුණු ජනාවාස පැවති බව ඉතිහාසඥයෝ ගවේෂණ මඟින් තහවුරු කෙරෙති. අනුරාධපුර, පෙලාන්නරු වැනි රාජකාරි පිළිබඳ අවධානය යොමු කිරීමේදී, ඒ යුගවල විසූ රජවරු අභිමානවත් ඉතිහාසයකට අවශ්‍ය සංස්කෘතියක් ගොඩනගා ඇත්තෝ ය. එය සුරකීම අප සතු වගකීමකි.

(ආ) සාමාන්‍ය පෙළ විභාගය අවසන් වූ වහාම සංකල්පයට සිහිපත්වූයේ ඇඹිලිපිටිය ප්‍රදේශයේ දිරියෙන් ජීවිතය ජයගත් තම මාමා පිළිබඳවය. දුර දක්නා නුවණින් තම කය මනස මෙහෙයවා වැඩකටයුතු කළ ඔහු අද වනවිට එම ප්‍රදේශයේ ධනවත් ව්‍යාපාරයෙකි. ඔහුගේ වස විසෙන් තොර පළතුරු වගාව ජනී ජනයා අතර ජනප්‍රිය වී ඔහුට වෙළෙඳපොළක් නිර්මාණය විය. සංකල්ප ඔබ යැයි සිතා නිර්මාණාත්මක රචනාවක් ගොඩනගන්න.

(ඇ) මෙරට ඇතැම් වැසියන් කොරෝනා කාල පරිච්ඡේදයේ තුළ විවේකයක් තම ජීවිතය ජය ගැනීමට යොදා ගත බව නොරහසකි. ඇතැමෙක් මහපොළාව සරු බිමක් කළහ. දරුවන් වැඩි වැඩියෙන් පොත් කියවීම, චිත්‍ර ඇඳීම, කතාපොත් ලිවීම ආදිය සිදුකර ඇති බව ජන මාධ්‍ය මගින් ද සනාථ විය. කාලය රන් හා සමානය යන්න ඔවුන් සිතට ගෙන වැඩ කර ඇති බව පැහැදිලි යි.

(ඈ) අධ්‍යාපනය තුළින් පොතේ දැනුම පමණක් නොව කරුණාවයි මෛත්‍රියයි සමාජය දෙස බලන පරපුරක් බිහි කිරීම අත්‍යවශ්‍යය. එවිට සදාචාරාත්මක පරපුරක් රටට බිහි වී වැඩිහිටි ගරුත්වය, ගුරු ගරුත්වය රැකෙන පරිදි තම චරියාව පවත්වා ගැනීමට සිදුකරන බව අමුතුවෙන් කිව යුතු නැත. එවැනි සදාචාරාත්මක අධ්‍යානයක අවශ්‍යතාවය කඩිනමින් අවශ්‍යව ඇත. (ලකුණු 25)

සියලුමහිමිකම්ඇවිරිනි / All Rights Reserved

03. පහත දැක්වෙන පාඨය කියවා වචන සංඛ්‍යාව 50-60 ත් වනසේ සාරාංශය කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව අග ලියන්න.

"ඉන්දීය සංස්කෘතික ප්‍රවාහයට සහම්බන්ධව නිර්මාණකරණයෙහි යෙදුණු ශ්‍රී ලංකාව ද භාරතීය කලා සම්ප්‍රදායන් ලාංකික ඉතිහාසය පුරා සනිටුහන් කරනු ලබන්නේ එහි යම් යම් වෙනස්කම් ඇතිකරගනිමින් ස්වාධීනත්වය මනාව පෙන්නුම් කරමින් ය. අප කලාකරුවාගේ විශේෂ කුසලතාවක් වන්නේ කලා නිර්මාණය තුළින් පුද්ගල සන්තානයට ආමන්ත්‍රණය කරමින් චාම් බවක් සිත්කළු බවක් තම නිර්මාණය තුළින් මතු කිරීමයි. භාරතීය කලාකරුවාගේ කලා සම්ප්‍රදායන් වඩ වඩාත් සංවර්ධනය කිරීමට අප කලාකරුවාට හැකි වී තිබෙන්නේ ඔහුගේ සිතුවිලි සමාධිගත වීම හරහා ය. ආගමික අවශ්‍යතා සඳහා ලෝකඩ මූර්ති නිපදවීමට ලක්දිව ඉතිහාසය ආරම්භවීමත් සමඟම පැවති බවට ශ්‍රී ලංකාවේ පැරණි මූලාශ්‍ර මඟින් තොරතුරු ලැබේ.

කලාකරුවා තම නිර්මාණ මගින් නිහඬ පණිවුඩයක් සමාජ ගත කරයි. එය තම නිර්මාණශීලී හැකියාව මත පිහිටා සිදුකරන්නකි. සඳකඩ පහණ, සමාධි පිළිමය, සීගිරි බිතුසිතුවම් ආදී නිර්මාණ දෙස බැලීමේදී ඒ බව වඩාත් සනාථ වේ. (ලකුණු 10)

04. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සමාජයේ දියුණු නවීන අවධියට එන විට නීතිය නම් වූ සමාජ සංස්ථාව පිහිටුවා ගෙන ව්‍යවස්ථාපිත විධිමත් නීතිමාලාවක් යටතේ සමාජයේ ජීවත්වන මිනිසුන්ගේ ක්‍රියාකාරකම්, හැසිරීම් සම්මත පිළිවෙළකට පාලනය කිරීම විධිමත් සමාජ පාලන උපක්‍රම යටතේ සිදුවේ. සමාජ විද්‍යාඥයන්ගේ අදහස වන්නේ සමාජයේ පාලනය කිරීමේ දී විධිමත් සමාජ පාලන ක්‍රම හා අවිධිමත් සමාජ පාලන ක්‍රම ඇති බවයි. ඒ අනුව නීතියට අනුව ව්‍යවස්ථාපිත නීති මාලාවකින් තොරව සමාජයක පවතින පාරම්පරික සම්මත සිරිත් විරිත්, සංස්කෘතික ආචාර ධර්ම, ආගමික විශ්වාස, පිළිගැනීම් ආදිය ඇසුරෙන් පුද්ගලයාගේ හැසිරීම පාලනය කිරීම, අවිධිමත් සමාජ පාලන ක්‍රම යටතේ ගොඩනැගෙන සමාජ පාලනයක් ලෙස හඳුන්වයි. මෙම උපක්‍රම **2**ම දියුණු නවීන සමාජවල සමාජ පාලන ක්‍රියාවලිය උදෙසා බලපානු ලබයි. එසේම සරල සාම්ප්‍රදායික සමාජවලට යහවීම් ඒවායේ ව්‍යවස්ථාපිත නීතිමාලාවකින් සමාජය පාලනය කරනවාට වඩා සමාජ සම්මත සිරිත් විරිත් ආදී ආචාර ධර්ම මඟින් සමාජය පාලනය කරන බව පෙනේ. සමාජයක් අවිධිමත් පාලනය ක්‍රියාවලිය පවත්වාගෙන යාමෙහි ලා පුද්ගලයාගේ යහපත පිණිස උරදෙන පහලතම ආයතනය ලෙස ආගම හඳුනාගත හැකිවේ.

(i) සමාජ විද්‍යාඥයකයන් පෙන්වා දෙන සමාජ පාලන ක්‍රම **2** ලියන්න.

(ii) සමාජ යහපත පිණිස පුද්ගල චරියාවන් පාලනය කරන ආයතනය කුමක් ද?

(iii) සරල සාම්ප්‍රදායික සමාජ පාලනය සඳහා වඩාත් උචිත ක්‍රමය කුමක් ද?

(iv) විධිමත් නීති මාලාව සඳහන් වන ලේඛනය කුමක් ද?

(v) මව විසින් අනුගමනය කරනු ලබන ආචාර ධර්ම අතුරින් **2**ක් ලියන්න.

(ලකුණු 2 x 5 = 10)

සියලුමහිමිකම්ඇවිරිනි / *All Rights Reserved*

**05.** දඹුල්ල ප්‍රාදේශීය වාර්තාකරු වන උපාලි ගුණතුංග දඹුල්ල මහා විද්‍යාලයේ දුරස්ථ (Online) ගුරු උපහාර උත්සවයට සම්බන්ධ වෙමින් ඔහුගේ සටහන් පොතෙහි තබා ගත් සටහන මෙසේයි.

* ගුරු උපහාර උළෙල 2021
* ප්‍රධාන ආරාධිත - කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ
* දිනය- 2021.10.05
* ආරාධිත පිරිස - විදුහල්පති,ගුරු භවතුන්, සිසු දරුවන්, දෙමාපියන්
* ගීත, නාට්‍ය ආදී දරුවන්ගේ දක්ෂතා හේතුවෙන් උත්සවය අලංකාර විය
* වෙලාව- පෙ.ව. 9.30 - 11.00 දක්වා
* සංවිධානය 2019 සාමාන්‍ය පෙළ සිසු දරුවන්

❖ **ඉහත තොරතුරු උපකාර කර ගනිමින් වචන 150 ක පමණ පුවත්පත් වාර්තාවක් ලියන්න.**

***නැතහොත්***

කොරෝනා සමයේදී ක්‍රීඩා කටයුතු අවම වීමත්, වැඩියෙන් ආහාර ගැනීමත් හේතුවෙන් පාසල් දරුවන් අතර තරබාරුකම වැඩි වී ඇත. මෙය නිසා සිදුවිය හැකි අතුරු ආබාධ වැළැක්වීම පිණිස පාසල් දැනුවත් කිරීමේ වැඩසටහනක් විද්‍යාලීය සෞඛ්‍ය සංගමය සංවිධානය කර ඇති මෙම වැඩසටහන පිළිබඳ සිසුන් දැනුවත් කිරීමට සුදුසු අත් පත්‍රිකාවක් සකස් කරන්න. පහත කරුණු ද උපකාර කර ගන්න.

- දිනය - 2022.02.10
- වේලාව - පෙ.ව. 9'00- 10'30
- මෙහෙයවීම - විශේෂඥ වෛද්‍යවරු
- සහභාගීකත්වය - 10, 11 ශ්‍රේණි දරුවන්

(ලකුණු **5**)

සියලුමහිමිකම්ඇවිරිනි / All Rights Reserved

# Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 11 – Second Term Test – January 2022
දෙවන වාර පරීක්ෂණය - 2022 ජනවාරි - 11 ශ්‍රේණිය

කාලය : පැය2
**Time : 2 hours**

| 21 | S | III |
|---|---|---|

## Sinhala litereature – III
සිංහල සාහිත්‍යය – III

Name :- .................................................... Grade : -................ Index number:-....................

- ❖ **ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**
- ❖ **1,2,3,4 යන ප්‍රශ්න වලටත් 5,6,7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.**
- ❖ **ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.**
- ❖ **පහත සඳහන් ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.**
- ❖ **යම් ප්‍රශ්නයකට පිළිතුරු නොලියන්නේ නම් අංකය යොදා ඉරක් අඳින්න.**

1. "පුක එයිත් මට කියාද ගන්නේ? ඇර ගන්ට"

(අ) ප්‍රකාශය කාගේ ද?

(ආ) අර ගන්නැයි කියන්නේ කුමක් ද?

2. පටන් ගත්තු නවසියයක් නැටුමට

(අ) නවසියයක් පිරිස කවරහු ද?

(ආ) මෙම අවස්ථාව කුමක් ද?

3. (අ) "කොටගොඩ" නම් ගම අයත් වන්නේ කිනම් සාහිත්‍යය නිර්දිෂ්ටයේ ද?

(ආ) එහි යාමට සැරසෙන්නේ කවුද?

4. ජාතිය රන් විමනක් වේ

ආගම මිණි පහනක් වේ.

................................

................................

(අ) ඉහත කවියේ ඉතිරි දෙපදය සම්පූර්ණ කරන්න.

(ආ) එහි ඇති කාව්‍යාලංකාරය කුමක් ද?

5. "පිං ඇති සරසවි වරමක් දෙන්නේ"

(අ) මෙහි සම්පාදකවරයා කවුද?

(ආ) ඔහු ලැබූ ජාත්‍යන්තර සම්මානයක් ලියන්න.

සියලුමහිමිකම්ඇවිරිනි / *All Rights Reserved*

6. "මට දැහැමි රජ කෙනෙක් ඇත්තාහු නොවෙති"
   - (අ) මෙම ප්‍රකාශය අසා සිටින්නේ කවුද?
   - (ආ) මෙම ප්‍රකාශය අයත් ග්‍රන්ථයේ රචකයා කවුද?

7. (අ) සද්ධර්මරත්නාවලිය රචනා කොට ඇත්තේ කවර කෘතියක් ඇසුරෙන් ද?
   - (ආ) ''ගල් රකින්නවුන්ගේ පුත බර උසුලනවුන්ගේ පුත"
     මෙම ප්‍රකාශය අසා සිටින්නේ කවුද?

8. (අ) ''අපට වැසිකිළියක්"කෙටි කතාව අයත් කෙටිකතා සංග්‍රහය කුමක් ද?
   - (ආ) එහි රචකයාගේ පිදුම් ලැබූ සම්මානය කුමක් ද?

9. සැළලිහිණි සංදේශයේ,
   - (අ) දූත ආශිර්වාදය රචනා වී ඇති විරිත කුමක් ද?
   - (ආ) අනෙක් කවි සඳහා භාවිත විරිත් කවරේ ද?

10. "මා දන්නේ මෙපමණක්'ම ය" නුඹ වහන්සේ අමුත්තන් දන්නා සේක් වී නම් පසිඳු මැනව"
    - (අ) මෙහි නුඹ වහන්සේ යනු කවරහු ද?
    - (ආ) විසඳන්නැයි කියන ප්‍රශ්නය කුමක් ද?

02. පහත සඳහන් ගද්‍ය පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) <u>කල දෝ දියෙන් පොඟවා</u> රන් <u>පුලින තලා</u>
සංගීතවත් වී යම් ඉදිරියට ගලා

- (අ) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.
- (ආ) කවි පද දෙකේ සම්පූර්ණ අර්ථය ලියන්න.

(ii) "සොඳුර මම යන්නට නොතිස්සෙමි, සතර දෙනෙකු කෙරෙහි ----නැති"

- (ආ) මෙම ප්‍රකාශය කරන්නේ කවුද? කාටද?
- (ආ) විස්වස් නැති සතර දෙනාගෙන් දෙදෙනෙක් ලියන්න.

(iii) නොයෙක් තැන ම පිපි මල් පිරුණු පොකුණු ය
ගෙයක් කන ම සැදැහෙන් දෙවන දකුණු ය
.......................................................
.......................................................

- (අ) ඉහත කවිය සම්පූර්ණ කරන්න.
- (ආ) මෙම පද්‍ය අයත් ග්‍රන්ථය හා එහි කතුවරයා කවුදැයි දක්වන්න.

(iv) උයිත් නොමැළිව පාත්‍රය ගෙන වූය බත් පාත්‍රය පුරා ලා ස්ථවිර භික්ෂූන්ට පිළිගන්වා ලා නිවන් දකුමෝව'යි පතා ගත්හ.

- (අ) මෙන් නිවන් පැතු අය කවරහුද?
- (ආ) මෙම අවස්ථාව කෙටියෙන් පහදන්න.

(v) ජාතක කතාවන්ට අයත් ආකෘතියක් ඇත. එම ආකෘතිය කොටස් තුනකි.

(අ) ඉන් දෙකක් ලියා දක්වන්න.

(ආ) ජාතක පොත ඇසුරෙන් රචිත කාව්‍ය ග්‍රන්ථ දෙකක් ලියන්න.

03. (i) දරුවන්ට ඇති ආදරය

(ii) සැමියාට ඇති ආදරය, සුප්පා දේවියගේ චරිතය ඇසුරෙන් මනාව නිරූපණය වේ. උදාහරණ දෙක බැගින් දෙමින් පහදන්න.

***නැතහොත්,***

(i) සරල වහර

(ii) වියත් වහර

ගුත්තිල කාව්‍ය රචනා කිරීමේදී වෑත්තෑවේ හිමියන් අනුගමනය කළ පිළිවෙතකි. උදාහරණ දෙක බැගින් දෙමින් විස්තර කරන්න.

04. සතර කන් මන්ත්‍රණය පාඩම තුළින්

(i) මහෞෂධ පඬිතුමාගේ පාණ්ඩිත්‍යය ද

(i) කේවට්ටයන්ගේ පාණ්ඩිත්‍යය ද පැහැදිලි වේ.

කොටස් දෙකට උදාහරණ දෙක බැගින් දෙමින් සනාථ කරන්න.

***නැතහොත්,***

(i) හංස සන්දේශයේ කැරගල වැනුම අලංකාර පරිසර වර්ණනාවකි.

(ii) එහි වැසියන්ගේ ආධ්‍යාත්මික හා භෞතික දියුණුවත් ගම්‍යමාන වේ. නිදසුන් දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න.

❖ **05, 06, 07 ප්‍රශ්නවලින් එකකට පමණක් පිළිතුරු සපයන්න.**

05. ළමා සිත් තුළ දේශාභිමානී හැඟීම් ජනිත කරවීමට එස් මහින්ද හිමියන්ගේ උත්සාහ "මුනි සිරිපා සිඹිමින්නේ" පද්‍ය පන්තිය තුළින් පෙන්නුම් කෙරේ. උදාහරණ තුනක් සමඟින් මේ කියමන සනාථ කරන්න.

06. අපට වැසිකිළියක් පාඩමෙන් ගැමියන් තුළ සෞඛ්‍ය පුරුදු හුරු කරවීමට නැතහොත් වැසිකිළි භාවිතයට නැඹුරු කරවීමට සෞඛ්‍ය පරීක්ෂකවරයා ගත් උත්සාහය සාර්ථක විය. ඔබගේ අදහස් උදාහරණ සහිතව ගෙනහැර දක්වන්න.

07. නොමග ගියත් සුමඟට ආ හැක. එහිදී පැන නගින අභියෝගයන්ට සාර්ථකව මුහුණ දිය යුතුය. ජය ගත හැකි බව උග්ගසේන සිටුපුත්හුගේ වස්තුව ඇසුරින් පැහැදිලි කරන්න.